එන්. රංජනී
5/12/20

# 4 ශ්‍රේණිය - ගණිතය - දිශා

ක්‍රියාකාරකම 1

පෙරවරු 8.30 - 9.30 අතර වේලාවක ඔබ එළිමහනට යන්න. ඔබ හිරු නැග එන දිශාවට මුහුණලා සිට ගන්න. කෙළින්ම හිරු දෙස නොබලන්න.

- හිරු නැග එන දිශාව නැගෙනහිර බව මතකයේ තබාගන්න.
- දැන් ඔබ දකුණු අත රූපයේ දැක්වෙන ලෙස දිගහරින්න.



- වම් අතද එසේ දිගුකරන්න.




- දකුණු දිශාවට ප්‍රතිවිරුද්ධ දිශාව උතුරු දිශාව වේ.
- මෙලෙසට නැගෙනහිර දිශාවට ප්‍රතිවිරුද්ධ දිශාව බස්නාහිර දිශාව වේ. එනම් ඔබේ පිටුපස පැත්ත බස්නාහිර දිශාවයි. මේ අනුව ප්‍රධාන දිශා හතර හොඳින් හඳුනාගන්න.



- දැන් මිදුලේ ප්‍රධාන දිශා හතරට යොමුවනසේ එකිනෙක කැපීයන රේඛා දෙකක් අඳින්න.




- පත්‍රිකා හතරක ප්‍රධාන දිශා හතරෙහි නම් ලියා, නිවැරදි දිශාවෙහි එය තබන්න.




- මෙය නැවත නැවත කීපවරක් කරන්න.

අනතුරුව දුවේ, යම්, යම් වස්තු හතරක් ගන්න.

උදා:- බෝලයක්, පිත්තක් ආදී ඔබ ලඟ ඇති දෙයක්.

එම වස්තූන් ප්‍රධාන දිශා හතරෙහි තබන්න. මැදින් බෝනික්කෙක් වැනි දෙයක් තබන්න.



ඔබම විවිධ ප්‍රශ්න අසමින් තවදුරටත් දිශා හතර ගැන හොඳ අවබෝධයක් ලබාගන්න.

එන්. රංජනී
5/12/20












1. මැද සිටින්නේ කවරෙක්ද?
2. ඇයට නැගෙනහිර දිශාවෙන් තිබෙන්නේ කුමක්ද?
3. ඇයට බස්නාහිර දිශාවෙන් තිබෙන්නේ කුමක්ද?
4. ඇයට දකුණු දිශාවෙන් තිබෙන්නේ කුමක්ද?
5. ඇයට උතුරු දිශාවෙන් තිබෙන්නේ කුමක්ද?